2021 Dinamina and Silumina -buddeni -buddeni.k@thirdshift.lk -0771617186



# ජන සිහින යා කරන විස්මිත කේබල් පාලම



## 'කල්‍යාණි රන් පිවිසුම' අද ජනතා අයිතියට



මෙරට විධිමත් ලෙස මාර්ග පාලම් ඉදිවීමට පටන් ගෙන අවුරුදු දෙසීය ඉක්මවයි. මුලින්ම ඉදි වූ මාර්ග අතර නුවර කොළඹ මහා මාර්ගයට හිමිවන්නේ පළමු තැනයි. මාර්ග අංක එක ලෙස මේ පාර නම් වන්නටද මෙය ප්‍රධාන හේතුවක්ව තිබුණි. එමෙන්ම අතීතයේ සිටම කොළඹත් මහනුවරත් සම්බන්ධ කරන ප්‍රධාන තැන බවට පත්වූයේ පෑලියගොඩ සහ ඔරුගොඩවත්ත ප්‍රදේශ යාවෙන ස්ථානයයි. කලින් කලට ස්ථාන වෙනස් වුව ද ප්‍රධාන ලෙසම කොළඹ නුවර යාකරන පාලම් තිබුණේ මේ ප්‍රදේශ ආශ්‍රිතවය. පාලම් පාරුවෙන් ඇරඹුණු මෙය පසුව එගොඩ මෙගොඩ යාකරන කණු මතින් ඉදිවන පාලමක් බවට පත්විය. එය පැරණි වික්ටෝරියා පාලම ලෙස හඳුන්වනු ලැබුණි. එම පාලමට ද ශතයකයකට වඩා දුර අතීතයක් තිබේ. ඉන්පසු ඉදි වූයේ ජපන් මිත්‍රත්ව පාලමයි. මේ පාලම නිසා කොළඹට මහනුවර දෙසින් පිවිසීමට තවත් පාලමක් විවෘත විය.එහි ප්‍රතිඵලය වූයේ කොළඹට ඇතුළත් වීමේදී තිබූ තදබදය අඩු වීමය. එම පාලම ඉදි වූ මුල් කාලයේදී තදබදයට හොඳ විසඳුමක් ඇති වුවද දශක ගණකට පසු විසි එක්වන සියවසේ දෙවන දශකය වන විට තත්ත්වය වෙනස් විය. එයට හේතු වූයේ මෙරට අධික වාහන ප්‍රමාණයක් මහමඟට පිවිසීම සහ එම වාහන ප්‍රමාණයට සාපේක්ෂව පාලම් සහ මාර්ග පද්ධතිය පුළුල් නොවීමයි. ඉන් පසු කොළඹ කටුනායක අධිවේගී මාර්ගය ඉදිවීමත් සමග පෑලියගොඩ තදබදය දෙගුණ තෙගුණ විය. කැලණිය පසුකර පෑලියගොඩ සිට පිටකොටුවට පිවිසීමට ගත වූ කාලය පැයකට වඩා වැඩි වූ අතර කොළඹ රාජකාරි සඳහා පැමිණෙන මිනිසුන්ට සිදු වූයේ මහමග රස්තියාදු වීමටය. ඒ පිළිබඳව කළ සමීක්ෂණවලින් තහවුරු වී ඇති කරුණු අනුව කාර්යබහුල වේලාවන්හිදි මෙම ස්ථානවල වාහනයක් ගමන් කළ හැකි උපරිම වේගය පැයට කිලෝ මීටර් පහත් දහයත් අතරය. මෙය ඉතාමත් තදින් බලපාන ලද ප්‍රශ්නයක් වූ අතර ඒ නිසා කොළඹට දෛනිකව පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත පිරිසකට මෙය අතිමහත් හිරිහැරයක් බවට පත්විය. මීගමුව දෙසින් සහ මහනුවර දෙසින් එන වාහන අනූදහසකට කිට්ටු වාහන ප්‍රමාණයක් එක් දිනකදී නව කැලණි පාලම සහ පැරණි වික්ටෝරියා පාලම ඔස්සේ කොළඹට ඇතුළු වේ. ඒ සමග බේස්ලයින් පාර ඔස්සේ දිනකට වාහන තිස් දහසක් පමණ ගමන් කරන අතර ඒ තත්ත්වය තුළ පෑලියගොඩ, ඔරුගොඩවත්ත බේස්ලයින් පාර, වරාය දෙසට යන හැම අතකටම ඇති වන්නේ දැඩි වාහන තදබදයකි. මේ තත්ත්වය නිසා දසකයකට වැඩි කාලයක් දිනෙන් දින මේ තදබදය පිළිබඳ අර්බුදය උග්‍ර වූ අතර එහි අවසානය වූයේ නොනවතින තදබදයක මුළු කොළඹම සිරවීමය.

ඒ අනුව මහා මාර්ග තාක්ෂණය පිළිබඳ විශේෂඥයන්ගේ අවධානය යොමු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස නව තාක්ෂණයට අනුගත පාලමක් ඉදිකිරීම සිදු කිරීමට තීරණය විය.

එහිදි යෝජනව වූයේ නව කැලණි පාලමට උඩින් කේබල් මත ඉදිවන නව පාලමක් ඉදිකිරීමය. එම පාලමට සමාන්තරව වරාය නගරය අතුරුගිරිය දෙසට වානේ කණු මත ඉදිවන අධිවේගී මාර්ගයද සම්බන්ධ කිරීමට යෝජනා විය. ඒ අනුව 2014 වන විට මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දැරූ රජය කේබල් මත දිවෙන නව පාලමේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ මූලික කටයුතු සූදානම් කළහ. ඉන්පසු බලයට පැමිණි ආණ්ඩුව ද 2019 බලයට පැමිණි පොදුජන පෙරමුණු ආණ්ඩුව ද මෙම පාලමේ කටයුතු ඉදිකිරීම් සඳහා සම්බන්ධ වූ අතර පසුගිය අවුරුදු දෙක තුළ පාලමේ ඉදිකිරීම් කටයුතු වේගවත්ව සිදු වුණි.

මෙම පාලම සහ වානේ මත දිවෙන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සම්පූර්ණ වූ පසු කොළඹ නගරය තුළ ඇති වාහන තදබදය බොහෝ දුරට විසඳෙන අතර කොළඹ වරාය, රාජගිරිය සම්පූර්ණ ව්‍යාපෘතියෙන් පසු පෑලියගොඩ සිට අතුරුගිරිය දෙසට විනාඩි ගණනාවකදී ගමන් කිරීමට ඉඩ ලැබේ. ඇත්තෙන්ම කාලයත් සමග තරගයක නියැළෙන මිනිසුන්ට එය මහා සහනයක් ලෙස සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය නිමාවට පත්කිරීම සඳහා රුපියල් කෝටි පන්දහස් තුන්සියයක් වැයවෙතැයි ගණනය කර තිබේ. මේ සඳහා වූ සියලු මුදල් ජයිකා ආධාර යටතේ සහන ණයක් ලෙස ලැබෙන අතර ඒ සඳහා ආසියානු සංවර්ධන බැංකුව සම්බන්ධව සිටියි.

ඉදි කළ නව පාලමේ ඇති සුවිශේෂත්වය සහ තාක්ෂණික විශ්මය වන්නේ මෙම පාලම කිසිලෙසකින් කැලණි ගඟ මතින් කිසිදු කුලුනක් නොමැතිව කේබල් මත ඉදිකිරීමයි. මෙය තාක්ෂණික විශ්මයක් සහ සවි ශක්තිය පිළිබඳ සහතිකයක් ලෙස සඳහන් කිරීමේ වරදක් නැත. ඒ සඳහා කේබල් අනූ හයක් යොදා ඇති අතර ඒ සඳහා පොළාව යටට කිදාබසින ලෙස ඉදිකිරීම් සිදු කර තිබේ. මේ ගැන සඳහන් කරන විශ්ලේශකයන් පවසන්නේ ප්‍රබල භූමි කම්පාවකට වුව ද මෙම පාලමේ සුලු චලනයක් හෝ සිදු නොවන තරමට තාක්ෂණය ප්‍රබල බවය. මෙම පාලමේ වගකීම් කාලය අවුරුදු සියයක් වන අතර අවුරුදු සියයක් ඉක්මවා ගිය ද තවත් කාලයක් මේ පාලම සුරක්ෂිත ලෙස පවතින බව සඳහන්ය.

මූලික ලෙස කැලණියේ ඉදිවන නව කේබල් පාලම කටුනායක අධිවේගී මාර්ගය අවසාන වන ස්ථානයේ සිට මීටර් තුන්සිය අසූවක් කොළඹ දෙසට ඉදිව ඇති අතර මෙහි මංතීරු හයකින් සමන්විත ධාවන තීරයක් තිබේ. ඇත්තෙන්ම තාක්ෂණය පිළිබඳ විශ්මයක් පමණක් නොව මෙරට මාර්ග සහ පාලම් ඉදිකිරීමේ විප්ලවීය අවස්ථාවක් ලෙස සඳහන් කිරීම නිවැරදිය.

මෙම පාලම් ව්‍යාපෘතියේම තවත් අංගයක් ලෙස බණ්ඩාරනායක වට රවුමේ සිට ඔරුගොඩවත්ත දක්වාත් අනෙක් පසින් ඔරුගොඩවත්තේ සිට ඉඟුරුකඩේ හන්දිය දක්වා වානේ කණු මත අධිවේගී මඟ ඉදිවන අතර පසුව එම මාර්ගය කොළඹ වරාය නගරය දක්වා දීර්ඝ කිරීමට ද නියමිතව තිබේ. මෙම මාර්ග පද්ධතියද නිසි ලෙස ක්‍රියාත්මක වූ පසු කොළඹ නගරය තුළ ගමන් කිරීම පහසු සහ ප්‍රියජනක දෙයක් වීම අනිවාර්යයෙන් සිදු වන්නකි.

මෙසේ නව කේබල් පාලම සහ ඒ ආශ්‍රිතව ඉදිවන වානේ කණු මත ඉදිවන මාර්ගය නිසා ඇතිවන බලපෑම නිසා නුවර පාරේ පවතින තදබදය ද බොහෝ සෙයින් අවසන් වනු ඇති අතර මීගමුව දෙසින් එන මාර්ගයේ තත්ත්වයද අදට වඩා තදබදයෙන් අඩු පහසු මඟක් බවට පත්වනු නියතය. එහි ප්‍රතිඵලය බවට පත්වන්නේ සාමාන්‍ය මාර්ග ඔස්සේ එන පොදු ප්‍රවාහන සේවා යතුරුපැදි ත්‍රිරෝද රථ සඳහා ද අදට වඩා ධාවනයට පහසු මඟක් බවට පත්වනු නියතය.

අද විවෘත වන පාලම හෙට දින සිට මේ සියලු ප්‍රශ්වලට විසඳුම් ලැබෙනු ඇතැයි කිසිවකු විශ්වාස කරනවා නම් එය වරදවා තේරුම් ගැනීමකි. එහෙත් අද ඇතිව ඇති උග්‍ර තදබදයට විසඳුම් කෙමෙන් ලබා ගත හැකි බවට විශ්වාස කළ හැකිය.

අද වන විට කොළඹ නගරය තුළ අධික තදබදයට හේතුවක් වී ඇත්තේ කාලයට අවශ්‍ය ලෙස මාර්ග පද්ධතිය දියුණු නොවීම වන අතර මේ ආකාරයේ මාර්ග පද්ධතියක් සහ නව පාලමක් ප්‍රමාද වී හෝ ඉදිකිරීම සහ ජනගත කිරීම රටක් සහ ජාතියක් ලෙස ආඩම්බර විය හැකි කරුණකි. සමහරුන් මෙයට විවිධ දේශපාලන කෝණ සහ පාට අදේශ කර කතා කරන්නට උත්සාහ කළ ද එහි ඇති ජාතික වැදගත්කම සහ රටට ලැබෙන අගය ගැන අවධානය යොමු කළ යුතුය. එනිසා අප කළ යුත්තේ මෙවැනි ජාතික වශයෙන් වැදගත් දේවල් වඩාත් ප්‍රතිඵල දායක ලෙස පරිහරණය කිරීමයි. එමෙන්ම පසුගිය දසකය තුළ රට පුරා ප්‍රධාන ලෙස සංවර්ධන කටයුතු මාර්ග ඉදිකිරීම් අධිවේගී මාර්ග ඉදිකිරීම් සිදු වුව ද කොළඹ මූලික කර ඇති කළ මෙම ව්‍යාපෘතිය සැබැවින්ම ජාතික වශයෙන් ප්‍රතිඵලදායක සහ වැදගත් එකක් වන අතර එයින් අපේ අග නගරයට ලැබෙන ආලෝකය සහ අගය විශාලය.

අද දිනයේ ඉදිවන මේ විස්මිත පාලම බොහෝ දෙනකුගේ කැපවීමක ප්‍රතිඵලයකි. හිටපු ජනාධිපති, වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ඍජු මැදිහත්වීම මත ආරම්භ කළ මේ විස්මිත ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට වත්මන් ආණ්ඩුව ගත් තීරණය පැසසුමට ලක්කළ යුතුමය. රටක සංවර්ධනයට ඍජුව උර දෙන මහා මාර්ග පද්ධතිය දියුණු කිරීම වෙනුවෙන් රජය ගන්නා ඍජු තීරණ අදට වඩා හෙට දිනයේ වඩාත් වැදගත් වනු ඇත.

**උදිත ගුණවර්ධන**
**ඡායාරූප - තිළිණ කල්තොටගේ**

---

# කාගිල්ස් 'ගමෙන් ගෙදරට'

## දෙමටගොඩ කාගිල්ස් චතුරස්‍රයේදී නැවතත් ඇරඹේ



කාගිල්ස් 'ගමෙන් ගෙදරට' යනු රටේ අංකුර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පුළුල් පාරිභෝගික ජාලයක් සමග සම්බන්ධ වීමට වේදිකාවක් ලබා දෙමින් ඔවුන්ව ශක්තිමත් කිරීමේ අරමුණින් ඇරඹූ වැඩසටහනකි. 2020 සැප්තැම්බර් මස එළිදැක්වූ මෙම වැඩසටහන කොවිඩ් වසංගත කාලය හේතුවෙන් තාවකාලිකව නවතා දැමීමට සිදු වුණි. පසුගිය වසරේ පැලවත්ත, කඳාන, මාලබේ, රාවතාවත්ත සහ කොස්වත්ත යන ශාඛාවලදී පැවැත්වූ මෙයට ජනතාවගෙන් ලැබුණේ ඉතා හොඳ ප්‍රතිචාරයන්ය.

මෙම වැඩසටහන පසුගිය සති අන්තයේදී (නොවැම්බර් 13 සහ 14) නැවතත් ආරම්භ කරනු ලැබුවේ දෙමටගොඩ කාගිල්ස් චතුරස්‍රයේදීය. ඒ සඳහා තෝරාගත් දේශීය ව්‍යවසායකයින් කිහිපදෙනෙක්ට ආරාධනා කරනු ලැබුවේ ඔවුන්ගේ විවිධත්වයෙන් යුත් නිෂ්පාදන අප සූදානම් කර තිබූ කුටිවල ප්‍රදර්ශනය කිරීමට ඉඩ සලසමිනි. අත් යන්ත්‍ර සහ හස්ත කර්මාන්ත, වේවැල් නිෂ්පාදන, බිම්මල් නිෂ්පාදන, සාම්ප්‍රදායික ආයුර්වේද ශාකසාර නිෂ්පාදන, රසකැවිලි සහ වෙනත් විවිධ කෑම වර්ග ආදිය මෙහිදී විකිණීමට තබා තිබුණි.

මෙම වැඩසටහනේ පළමු දිනයේදී ප්‍රධාන අමුත්තා ලෙසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂක නිහාල් ලියනගේ මහතා සහභාගී වූවේය. එසේම කාගිල්ස් සිලෝන් පොදු සමාගමේ උප සභාපති රංජිත් පේජ් මහතා, කාගිල්ස් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී සෙනරත් බණ්ඩාර මහතා සහ ආයතන දෙකේම සාමාජිකයින් මෙම අවස්ථාවට එක් වූයේ දේශීය ව්‍යවසායකයින් ශක්තිමත් කරමින් ඔවුන්ගේ නිෂ්පාදන මිලදී ගැනීමට සහභාගිවූ පාරිභෝගිකයින් සමග එක්වෙමිනි.

පවතින තත්ත්වය හමුවේ, මෙම අවස්ථාවට පැමිණි සියලු දෙනාට ආරක්ෂිත පරිසරයක් සහතික කිරීම සඳහා අවශ්‍ය සියලුම සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදින ලදී.

රටක් ලෙස වර්තමානයේ සියලු දෙනා මුහුණ දෙන අසීරු කාලයේදී උපයා ගත හැකි වූ ආදායම ගැන පමණක් නොව කාගිල්ස් කණ්ඩායම සමග සමීපව වැඩ කිරීම හරහා ඔවුන් ලබා ගත් තාක්ෂණික දැනුම වෙනුවෙන් මෙම දෙදින වැඩසටහනට සහභාගී වූ දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සිය කෘතඥතාවය පළ කළෝය.



මෙම වැඩසටහන පසුපස ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වඩාත් විශාල වෙළඳපොළක් නිර්මාණය කරමින් ඔවුන්ගේ වපසරිය පුළුල් කිරීමේ චින්තනයයි. එසේම ඇසුරුම්කරණය. අලෙවිකරණය සහ තත්ත්ව ආරක්ෂාව වැනි අංග පිළිබඳ තාක්ෂණික දැනුම ලබා දෙමින් ඔවුන්ගේ ජීවිකාව ඉහළ නැංවීමටද පියවර ගැනේ. සිය ව්‍යාපාරය තව තවත් දියුණු කරගැනීමට අවශ්‍ය මූල්‍ය සහය නිරන්තරයෙන් සැපයීමට කාගිල්ස් බැංකුවද කැපවී සිටී.

ඉදිරියේදීත් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පුළුල් වෙළඳපොළක් සපයමින්, කාගිල්ස් 'ගමෙන් ගෙදරට' තෝරාගත් කාගිල්ස් ෆුඩ්සිටි ශාඛාවන්හිදී පැවැත්වෙනු ඇති අතර, ඔවුන්ට සවියක් වන්නට අප හා එක් වන ලෙසින් සෑම පාරිභෝගිකයෙකුගෙන්ම හිතවත්ව ඉල්ලා සිටින්නෙමු.

